# අත්හිටුවීම සම්බන්ධ ක්‍රියාපටිපාටිය

## ඔබගේ දරුවාව අත්හිටුවීමෙන් පසු දෙමාපියන්* හට තොරතුරු

සිසුවාගේ අදාල පුද්ගලයා හට මෙම පොත් පිංච, අත්හිටුවීමේ දැන්වීම සමග ලබාදිය යුතුය.

මෙම පොත්පිංච මගින් සිසුන් සහ ඔවුන්ගේ අදාල පුද්ගලයා හට පහත තොරතුරු ලබාදේ:

- ඔබගේ දරුවාගේ අත්හිටුවීම සම්බන්ධයෙන් යම් ගැටළුවක් ඇතිනම් කලයුතු දේ
- අත්හිටුවීමකට පසු පාසැල මගින් සිසුවාට උපකාර කල හැකි ආකාරය
- වැඩිදුර තොරතුරු සහ උපකාර සඳහා යායුතු ස්ථාන

අත්හිටුවීමේ ක්‍රියාවලිය සම්බන්ධ, කාර්‍යභාරය සහ වගකීම් ඇතුලත්, අමතර තොරතුරු සඳහා සහ අත්හිටුවීමට පෙර ඔබ විසින් අපේක්ෂා කල හැකි දේ සඳහා www.education.vic.gov.au/school/parents/behaviour/Pages/faqs.aspx වෙබ් අඩවිය බලන්න.

### මාගේ දරුවාව පාසැලෙන් අත්හිටුවා ඇත. මෙයින් කුමක් අදහස්වේද?

අත්හිටුවීමක් යනු සිසුවෙකුව නියම කරන ලද කාලයකට තාවකාලිකව පංතිවලින් හෝ අනුමත කරන ලද ක්‍රියාකාරකම්වලින් ඉවත් කිරීම ඇතුලත් විනයානුකූල ක්‍රියාමාර්ගයකි. නියම කරන ලද කාලසීමාවෙන් පසුව ඔබගේ දරුවා හට පංතිවලට හෝ අනුමත කරන ලද ක්‍රියාකාරකම්වලට නැවත යාමට අවසර ලැබේ.

### අත්හිටුවීමට පෙර විදුහල්පතිතුමා විසින් කුමන කරුණු සැලකිල්ලට ගෙන තිබේද?

සිසුවෙකුව අත්හිටුවීමට පෙර විදුහල්පතිවරයෙකු විසින් පහත දේ කරන බවට වග බලා ගත යුතුය:

- සිසුවා හට කීමට ඇති දේ කීමට අවස්ථාව ලබාදුන් බව
- සිසුවා හෝ ඔවුන්ගේ අදාල පුද්ගලයා විසින් ලබාදුන් කිසියම් තොරතුරක් හෝ ලියවිල්ලක් ඇතිනම්, අත්හිටුවීම සම්බන්ධ තීරණය ගැනීමේදී ඒවා සැලකිල්ලට ගැනීම
- අත්හිටවනු ලැබූ සිසුවාගේ හැසිරීම සම්බන්ධයෙන් ගතහැකි වෙනත් ක්‍රියාමාර්ග සලකා බැලීම.

### වහාම ක්‍රියාත්මක වන අත්හිටුවීමක් යනු කුමක්ද?

වහාම ක්‍රියාත්මක වන අත්හිටුවීමක් සිදුකල හැක්කේ සිසුවෙකුව සාමාන්‍ය වශයෙන් අත්හිටුවීමට අවශ්‍ය පදනමට අමතරව, ඔවුන්ගේ හැසිරීම හේතුවෙන් ඔවුන්ගේ, කාර්‍ය මණ්ඩලයේ සහ වෙනත් සිසුන්ගේ සෞඛ්‍යය, ආරක්ෂාව සහ සුබසාධනය සැලකිය යුතු මට්ටමක අවදානමට ලක්කරන අවස්ථාවලදී පමණි.

විදුහල්පති විසින් වහාම ක්‍රියාත්මක වන අත්හිටුවීමක් ලබාදීම අවස්ථානුගත කරුණු අනුව යෝග්‍ය බවට තීරණය කර ඇති විට, පාසැල් කාර්‍ය මණ්ඩලය මගින් මෙම තීරණය ඔබට හැකි විගස දැනුම් දීමට උත්සාහ ගෙන තිබිය යුතු අතර, ඔබ විසින් ප්‍රායෝගික වශයෙන් හැකි විගස දරුවාව රැගෙන යා යුතුය.

ඔබ හා සම්බන්ධවීමට නොහැකිවූ අවස්ථාවල සහ/හෝ ඔබගේ දරුවාව රැගෙන යාමට කටයුතු කිරීමට ඔබට නොහැකි අවස්ථාවල, පාසැල් දිනය හෝ පාසැල මගින් අනුමත ක්‍රියාකාරකම අවසන් වන තෙක් විදුහල්පතිවරයා විසින් දරුවාව ප්‍රමාණවත් ආකාරයට අධීක්ෂණය කිරීමට කටයුතු පිළියෙල කර තිබිය යුතුය.

සාමාන්‍ය තත්වයන් යටතේ ක්‍රියාත්මක කරනු ලබන අත්හිටුවීමක් සහ වහාම ක්‍රියාත්මක වන ලෙස සිදු කරනු ලබන අත්හිටුවීමක් අතර කාලය පිළිබඳ වෙනස්කම් තිබුණද, ක්‍රියාවලිය එක සමාන වන අතර විදුහල්පතිවරයා විසින් දරුවා හට කීමට ඇති දේ කීමට අවස්ථාව ලබාදෙන බවත්, ඔහු හෝ ඇයගේ අවස්ථානුගත කරුණු සැලකිල්ලට ගත යුතු බවත් මතක තබා ගැනීම වැදගත්වේ.

### මාගේ දරුවාව කොපමණ කාලයකට අත්හිටුවා තැබිය හැකිද?

සිසුවෙකුව වරකට දිගටම අත්හිටුවිය හැකි උපරිම කාලය වන්නේ පාසැල් දින 5කි.

මෙයට අමතරව, පාසැල් වසරක් තුල සිසුවෙකුව ප්‍රාදේශීය අධ්‍යක්ෂකවරයාගේ ලිඛිත අනුමැතිය නොමැතිව දින 15කට වැඩිපුර කාලයක් අත්හිටුවා තැබිය නොහැකි.

### මාගේ දරුවාගේ හැසිරීම අත්හිටුවීමක් ලබාදීමට තරම්ද යන්න පැහැදිලි නැතිනම් මා විසින් කුමක් කල යුතුද?

සෑම පාසැලක් සතුවම පාසැල් ප්‍රජාව මගින් සිසුන්ගේ සහභාගිත්වය, ගෞරවනීය හැසිරීම සහ පාසැලට පැමිණීම ආදී ක්ෂේත්‍රවල බෙදාහදාගත් අපේක්ෂාවන් දැක්වූ සහභාගිත්ව ප්‍රතිපත්තියක් (En-gagement Policy) තිබීම අපේක්ෂා කරන අතර එක් එක් සිසුන්ගේ අවස්ථානුගත කරුණු සම්බන්ධයෙන් පාසැල ප්‍රතිචාර දක්වන ආකාරය සම්බන්ධයෙන් මේ මගින් මග පෙන්වීමක් ලබාදේ.

ඔබ විසින් පාසැලෙ *සිසු සහභාගිත්ව ප්‍රතිපත්තිය (Student Engagement Policy)* ඇතුලත් පිටපතක් ලබාදෙන ලෙස පාසැලෙන් ඉල්ලා සිටිය හැකිය, නැතහොත් ඔවුන්ගේ වෙබ් අඩවියෙන් ලබාගත හැක. මෙම ප්‍රතිපත්තිය මගින් ඔබගේ පාසැල තුල හැසිරීම සම්බන්ධයෙන් ඇති අපේක්ෂාවන් දක්වා ඇති අතර මෙම අපේක්ෂාවන් බිඳදමා ඇතිද යන්න නිර්ණය කිරීමට මෙය හොඳ යොමුවකි. www.education.vic.gov.au/school/principals/participation/Pages/engagepol.aspx

*හෝ අදාල පුද්ගලයා. අදාල පුද්ගලයෙකු හඳුනා ගැනීම *('IDENTIFYING A RELEVANT PERSON')* සම්බන්ධ වැඩිදුර විස්තර සඳහා පහත වෙබ් අඩවිය බලන්න: www.education.vic.gov.au/school/principals/participation/Pages/relevantperson.aspx

අත්හිටුවීම් දරුණු විනය ක්‍රියාමාර්ගයන් වන අතර වෙනත් ක්‍රියාමාර්ග මගින් සතුටුදායක ප්‍රතිඵල ලබා නොදෙන සිදුවීම් සම්බන්ධයෙන් පමණක් මෙම ක්‍රියාමාර්ගය වෙන්කර තැබීම වඩා යෝග්‍යවේ.

ඔබගේ දරුවා පාසැලේ සිටින අතර හෝ, පාසැලට පැමිණෙන හෝ පාසැලෙන් යන අතරතුර හෝ පාසැලෙන් පිටතදී පාසැල් ක්‍රියාකාරකමක නිරත වනවිට (එම ක්‍රියාකාරකමට යනවිට හෝ එම ක්‍රියාකාරකමින් පැමිණෙන විට ඇතුළුව), ඔවුන් පහත ආකාරයට හැසිරුණි නම් ඔවුන්ව අත්හිටුවිය හැකිය -

- සත්‍ය වශයෙන්, දැනෙන ආකාරයට හෝ තර්ජනය වන ආකාරයට ඕනෑම අයෙකුගේ සෞඛ්‍යයට ආරක්ෂාවට හෝ සුබසිද්ධියට අනතුරක් සිදුවන ආකාරයට හැසිරීමෂ
- දේපළවලට සැලකියයුතු ආකාරයට අලාභහානි කිරීම හෝ විනාශ කිරීමෂ
- දේපළ සොරකම් කිරීම හෝ එසේ කිරීමට උත්සාහ කිරීම හෝ දැනගෙනම එසේ කිරීමෂ
- නීතිවිරෝධී මත්ද්‍රව්‍ය හෝ ආයුධ ළඟ තබා ගැනීම, භාවිතය හෝ අලෙවි කිරීම හෝ වෙනත් අයෙකු හට සිතාමතාම ළඟ තබා ගැනීමට උපකාර කිරීම;
- කාර්‍ය මණ්ඩලය ලබාදුන් පැහැදිලි සහ සාධාරණ උපදෙස් අනුව කටයුතු කිරීමට අසමත්වීම මගින් සත්‍ය වශයෙන්, දැනෙන ආකාරයට හෝ තර්ජනය වන ආකාරයට ඕනෑම අයෙකුගේ සෞඛ්‍යයට ආරක්ෂාවට හෝ සුබසිද්ධියට අනතුරක් සිදුවන ආකාරයට හැසිරීමෂ
- වයසෂ දරුවෙකුට මව්කිරි දීමෂ ස්ත්‍රී පුරුෂබවෂ අනන්‍යතාවයෂ බෙලහීනතාවයෂ කාර්මික ක්‍රියාකාරකම්ෂ නීත්‍යානුකූල ලෙස කරන ලිංගික ක්‍රියාකාරකම්ෂ විවාහ අවිවාහක බවෂ මාපිය තත්වයෂ භෞතික ලක්ෂණෂ දේශපාලන විශ්වාසය හෝ ක්‍රියාකාරකම්ෂ ගර්බනීබවෂ ජාතියෂ ආගමික විශ්වාස හෝ ක්‍රියාකාරකම්ෂ ලිංගික හැඩගැස්මෂ යන කරුණු මත වෙනත් පුද්ගලයෙකු දිගින් දිගටම අපකීර්තියට පත් කිරීම, අපවාද කිරීම හෝ ලැජ්ජාවට පත් කිරීම යන ආකාරයට හැසිරීමෂ ඉහත ගති ලක්ෂණ ඇති ලෙස හඳුනාගත් අයෙකු සමඟ පුද්ගලික ඇසුර (නෑයෙකු හෝ වෙනත් ආකාරයට)ෂ
- වෙනත් ඕනෑම සිසුවෙකුගේ සුබසිද්ධිය, ආරක්ෂාව හෝ අධ්‍යාපනික අවස්ථාවලට බලපාන ආකාරයට නිරන්තරයෙන් නිෂ්ඵල ලෙස හැසිරීම.

යම් නිශ්චිත අවස්ථාවක සිසුවෙකුව අත්හිටුවනවාද යන්න නිර්ණය කිරීම විදුහල්පතිවරයාගේ වගකීමවේ. අත්හිටුවීමේ ක්‍රියාවලිය හෝ ඔබගේ දරුවාගේ හැසිරීම සම්බන්ධයෙන් යම් ගැටළුවක් ඇතිනම්, ඔබගේ දරුවා, ඔබට ඇති ගැටළු, සහ අත්හිටුවීමට හේතු සහ පදනම සම්බන්ධයෙන් විදුහල්පතිවරයා හමුව සාකච්ඡා කරන ලෙස අපි ඔබව උනන්දු කරමු.

අත්හිටුවීමේ කාර්‍යාවලියේදී හෝ අත්හිටුවීම ක්‍රියාත්මක කිරීමට පසුව වුවද, ඕනෑම අවස්ථාවකදී ඔබ හට විදුහල්පතිවරයා සමඟ රැස්වීමකට සහභාගි විය යුතු බවට ඉල්ලා සිටිය හැකිබව මතක තබා ගැනීම වැදගත්වේ.

ඔබට ඇති ගැටළු හොඳින් සලකා බලා නොමැති බව ඔබට හැඟේනම්, ඔබට ආසන්නයේම ඇති දෙපාර්තමේන්තු ප්‍රාදේශීය කාර්‍යාලයේ සිටින ප්‍රජා සම්බන්ධීකරණ නිලධාරියා (Community Liaison Officer) හෝ මෙම පොත් පිංච අවසානයේ දක්වා ඇති උපකාරක සේවා සමඟ සම්බන්ධවන්න.

## පාසැල තුල සිට සිදුකරන අත්හිටුවීමක් (In-school suspension) යනු කුමක්ද? මේ මගින් මාගේ දරුවාට කුමක් සිදුවේද?

පාසැල තුල සිට සිදුකරන අත්හිටුවීමක් යනුවෙන් අදහස් වන්නේ සිසුවෙකු අධීක්ෂණය යටතේ පාසැල් භූමිය තුල සිටින අතර පංතිවලට සහභාගි නොවීමයි. මෙයට පහතදේ ඇතුලත් විය හැකිය:

- සිසුවාව එම දිනය වෙනුවෙන් පලපුරුද්ද ඇති ගුරුවරයෙකු හෝ යෝග්‍ය කාර්‍ය මණ්ඩල සමාජිකයෙකු සමඟ එකට තැබීම සහ අදාල ගුරුවරයා සමඟ සිසුවාව පංතිවලට යැවීම
- පාසැල තුල සිට සිදුකරන අත්හිටුවීමක් සමඟ වැඩකට සහභාගිවීම (උදා. එළිමහනේ වැඩ කිරීම හෝ අධ්‍යාපනික ද්‍රව්‍ය පිළියෙල කිරීම)
- යෝග්‍ය අධීක්ෂණය යටතේ සිසුන් හට පාසැල තුල සිට සිදුකරන අත්හිටුවීම සම්පූර්ණ කිරීමට ඒ සඳහා වෙන්වුණු කාමරයක් ලබාදීම.

නිශ්චිත පාසැල සහ අවස්ථානුගත තත්වයන්ට අනුව මෙය වෙනත් ආකාරයක් ගත හැකිය.

මෙය සාම්ප්‍රදායික පාසැලෙන් පිටත අත්හිටුවීමකින් වෙනස් වුවද ආකාර දෙක සම්බන්ධයෙන්ම ක්‍රියාවලිය සමාන විය යුතු අතර, ඔබ හට සමාන ආකාරයේ දැන්වීමක් සහ ලියකියවිලි ලැබිය යුතු බව මතක තබා ගැනීම වැදගත්වේ.

## මාගේ දරුවාව අත්හිටුවන විට පාසැල මගින් මා වෙත කුමන තොරතුරු ලබාදිය යුතුද?

විදුහල්පතිවරයෙකු විසින් අත්හිටුවීමක් යෝග්‍ය බව නිර්ණය කල විට, පාසැල මගින් ඔබට සහ ඔබගේ දරුවාට පහත ලියකියවිලි ලබාදිය යුතුය:

- *අත්හිටුවීමේ දැන්වීම (Notice of Suspension)* සහ
- මෙම පොත් පිංච.

විදුහල්පතිවරයා විසින් පහත තොරතුරුද ලබාදිය යුතුය:

- අත්හිටුවීමට හේතුව
- අත්හිටුවීම සිදුවන පාසැල් දිනයන්
- අත්හිටුවීම සිදුවන ස්ථානය (එනම්. පාසැල් පරිශ්‍රයේද නැතිනම් වෙන ස්ථානයකද යන්න)
- අදාල ආකාරයට ඔබට සහ ඔබගේ දරුවාට අමතර උපකාරක සේවා සඳහා සම්බන්ධවීමේ තොරතුරු
- අත්හිටුවන කාලය සඳහා ඔබගේ දරුවාට යෝග්‍ය පාසැල් වැඩ කිරීම සඳහා ප්‍රතිපාදන සැලසීමට පිළියෙල කිරීම

**සටහන්:**

(1) ඔබගේ දරුවාව දින 3ක් හෝ ඊට අඩු කාලයකට අත්හිටුවා ඇතිනම්, ඔවුන් පාසැලේ නැති අතර සම්පූර්ණ කිරීමට අර්ථවත් වැඩ ලබාදෙන බවට විදුහල්පතිවරයා විසින් වගබලා ගත යුතුය.

(2) ඔබගේ දරුවාව දින 3කට වැඩි කාලයකට අත්හිටුවා ඇතිනම්, *සිසුවා පාසැලේ නැතිවිට ඉගෙනීමේ සැලැස්මක් (Student Absence Learning Plan)* සහ *නැවත පාසැලට පැමිණීමේ සැලැස්මක් (Re-turn to School Plan)* සිසුවා හට ලබාදෙන බවට විදුහල්පති විසින් වගබලා ගත යුතුය.

## මාගේ දරුවාව අත්හිටවූ විට ඔවුන් කුමක් කරනු ඇතිද? පාසැල විසින් ඔහු/ඇය හට වැඩ දිය යුතුද?

දින තුනක් හෝ අඩු කාලයක් සඳහා අත්හිටුවීමේදී, සිසුවෙකු හට අර්ථවත් වැඩ ලබාදෙනු ඇතැයි අපේක්ෂා කෙරේ. සිසුවෙකු දින තුනකට වැඩි කාලයක් අත්හිටුවා ඇතිවිට සිසුවා පාසැලේ නොමැති සැලැස්මක් (Student Absence Plan) සහ නැවත පාසැලට පැමිණීමේ සැලැස්මක් (Return to School Plan) සැකසිය යුතුය. මෙම සැලසුම්වලට අදාල ආකෘති (Templates) පහත වෙබ් අඩවියෙන් ලබාගත හැකියඃ

www.education.vic.gov.au/school/principals/participation/Pages/resources.aspx

## අත්හිටුවීම අවසානයේ කුමක් සිදුවේද?

අත්හිටුවීම අවසානවුණු පසු, දරුවා හට නැවත පාසැලට එමට උපකාර කල යුතුය.

ඔබගේ දරුවාව පාසැල් දින තුනක් හෝ වැඩි ගණනක් අත්හිටුවා ඇතිනම්, අත්හිටුවීමෙන් පසු  පාසැල, ඔබ සහ ඔබගේ දරුවා සමග සිසු උපකාර කණ්ඩායම් (Student Support Group) රැස්වීමක් පැවැත්වීම නිර්දේශ කෙරේ. දරුවා නැවත පාසැලට පැමිණෙන විට හෝ අත්හිටුවීමට හේතුවූ සිද්ධිය සම්බන්ධ හැසිරීමේ ගැටළු නිරාකරණය කර ගැනීමට ඔබගේ දරුවාට අමතර උපකාර අවශ්‍ය බව ඔබට හැගෙන අවස්ථාවලදී, සිසු උපකාර කණ්ඩායම් රැස්වීමක් පවත්වන ලෙස ඔබ විසින් ඉල්ලා සිටිය හැකිය.

මෙම රැස්වීමේ අරමුණ වන්නේ පහත සඳහන් කරුණු සාකච්ඡා කිරීමට අවස්ථාවක් ලබාදීමවේඃ

- *සිසුවා පාසැලේ නැතිවිට ඉගෙනීමේ සැලැස්මක් (Student Absence Learning Plan)* සහ පාසැල් වැඩ, අත්හිටවූ කාලය තුල සම්පූර්ණ කලාද යන්න සොයා බැලීම
- පාසැල තුලදී සහ ඉන් පිටතදී ඔබගේ දරුවාගේ අධ්‍යාපනික, සාමාජයීය සහ චිත්තවේගී අවශ්‍යතා සපුරාලීමට උපාය මාර්ග වර්ධනය කිරීම
- මෙම උපාය මාර්ගයන් හට උපකාර කිරීමට ඔබට, ඔබගේ දරුවාට, පාසැල් කාර්ය මණ්ඩලයට සහ වෙනත් වෘත්තීකයන් හට වෙන වෙනමම ඇති වගකීම්.

සිසු උපකාර කණ්ඩායම් රැස්වීම් සම්බන්ධ වැඩි තොරතුරු සඳහා පහත වෙබ් අඩවිය බලන්න
www.education.vic.gov.au/school/principals/spag/participation/Pages/supportgroups.aspx

පාසැල් හට කුමන උපකාර ලබාගත හැකිද යන්න වැඩිදුර තොරතුරු සඳහා
www.education.vic.gov.au/school/principals/participation/Pages/interventions.aspx හි *Strategies and Supports Available to Schools* බලන්න.

## මා හට අත්හිටුවීමක් සම්බන්ධයෙන් අභියාචනයක් කල හැකිද?

අත්හිටුවීමක් අභියාචනය කිරීමට ක්‍රියාවලියක් නොමැත.

ඔබගේ දරුවාව අත්හිටුවීම සම්බන්ධ කිසියම් ගැටළුවක් ඇතිනම්, ඔබ විසින් පාසැලේ විදුහල්පතිවරයා සමග අදාල ගැටළු සාකච්ඡා කල යුතුය.

පාසැලේ විදුහල්පතිවරයා විසින් ඔබට ඇති ගැටළු ප්‍රමාණවත් ලෙස සලකා බලා නොමැතිනම්, ඔබගේ පළාතේ ප්‍රාදේශීය කාර්යාලයේ ප්‍රජා සම්බන්ධීකරණ නිලධාරියා (Community Liaison Officer) හා සම්බන්ධ විය හැකිය.

ඔබට ඇති ගැටළු ප්‍රදේශීය කාර්යාලය මගින් ප්‍රමාණවත් ආකාරයට සලකා ඇති බවට ඔබ විශ්වාස නොකරන්නේ නම්, ඔබ විසින් ප්‍රාදේශීය අධ්‍යක්ෂකවරයා හට හෝ නිසි පැමිණිල්ලක් කිරීම සඳහා ප්‍රාදේශීය උපකාරක කණ්ඩායමේ (Regional Support Group) නියෝජ්‍ය ලේකම් වෙත ලිවිය හැකිය.

මාපිය පැමිණිලි සම්බන්ධ වැඩිදුර විස්තර, දුරකථන අංක සහ වැඩිදුර සම්බන්ධතා තොරතුරු
www.education.vic.gov.au/about/contact/parentcomplaint.htm හි DET වෙබ් අඩවියෙන් ලබාගත හැකිය.

## වැඩිදුර තොරතුරු හෝ උපකාර සඳහා මා විසින් කා සමග සම්බන්ධ විය හැකිද?

අත්හිටුවීම සහ නෙරපීම සම්බන්ධ ක්‍රියාපටිපාටීන් සිසු සහභාගිත්ව සහ අන්තර්ගත කර ගැනීම සම්බන්ධ මාර්ගෝපදේශය (Student Engagement and Inclusion Guidance)
www.education.vic.gov.au/school/principals/participation/Pages/studengage.aspx යන වෙබ් අඩවිය වෙත යාම මගින් බලා ගත හැකිය.

අත්හිටුවීම සහ නෙරපීම සම්බන්ධව දෙමාපියන් විසින් නිතර අසන ප්‍රශ්න (FAQs) පහත වෙබ් අඩවියේ ඇතඃ

www.education.vic.gov.au/school/parents/behaviour/Pages/faqs.aspx

ඔබට අමතර තොරතුරු සහ උපකාර අවශ්‍යනම්, ඔබට සමීපයේම ඇති ප්‍රාදේශීය කාර්යාලයේ සිටින ප්‍රජා සම්බන්ධීකරණ නිලධාරියා (Community Liaison Officer) සමග සම්බන්ධ විය යුතුය (සම්බන්ධවීමේ තොරතුරු මීළඟ පිටුවේ ඇත).

# අධ්‍යාපන සහ බාල ළමාවිය සංවර්ධන දෙපාර්තමේන්තු ප්‍රාදේශීය කාර්යාලය

## ඊසානදිග වික්ටෝරියානු කලාපය
## (NORTH EASTERN VICTORIA REGION)

ඊමේල්: nevr@edumail.vic.gov.au

**බෙනලා**

තැපැල්: PO Box 403, Benalla, Victoria 3672
ස්ථානය: 150 Bridge Street East, Benalla, Victoria 3672
දුරකථනය: (03) 5761 2100
ෆැක්ස්: (03) 5762 5039

**ග්ලෙන් වෙවර්ලි**

ස්ථානය: Level 3, 295 Springvale Road, Glen Waverley 3150, Victoria
දුරකථනය: (03) 9265 2400
ෆැක්ස්: (03) 9265 2444

## ගිනිකොනදිග වික්ටෝරියානු කලාපය
## (SOUTH EASTERN VICTORIA REGION)

ඊමේල්: sevr@edumail.vic.gov.au

**ඩැංඩිනොංග්**

තැපැල්: PO Box 5, Dandenong 3175
ස්ථානය: 165-169 Thomas Street, Dandenong 3175
දුරකථනය: (03) 8765 5600
ෆැක්ස්: (03) 8765 5666

**මෝ**

තැපැල්: PO Box 381, Moe, Victoria 3825
ස්ථානය: Corner Kirk and Haigh Streets, Moe, Victoria 3825
දුරකථනය: (03) 5127 0400
ෆැක්ස්: (03) 5126 1933

## වයඹදිග වික්ටෝරියානු කලාපය
## (NORTH WESTERN VICTORIA REGION)

ඊමේල්: nwvr@edumail.vic.gov.au

**බෙන්ඩිගෝ**

තැපැල්: PO Box 442, Bendigo, Victoria 3552
ස්ථානය: 7-15 McLaren Street, Bendigo, Victoria 3550
දුරකථනය: (03) 5440 3111
ෆැක්ස්: (03) 5442 5321

**කෝබර්ග්**

තැපැල්: Locked Bag 2001, Coburg, VIC 3058
ස්ථානය: Level 2, 189 Urquhart Street, Coburg, VIC 3058
දුරකථනය: (03) 9488 9488
ෆැක්ස්: (03) 9488 9400

## නිරිතදිග වික්ටෝරියානු කලාපය
## (SOUTH WESTERN VICTORIA REGION)

ඊමේල්: swvr@edumail.vic.gov.au

**බැලරාට්**

තැපැල්: 109 Armstrong Street North, Ballarat, 3350
දුරකථනය: (03) 5337 8444
ෆැක්ස්: (03) 5333 2135

**වෙස්ට් ෆුට්ස්ක්‍රේ**

ස්ථානය: Level 3, Whitten Oval, 417 Barkly Street, West Footscray, 3012
*(ඇතුළුවීම පැත්තට තල්ලුකරන වීදුරු දොර ඔස්සේ)*
දුරකථනය: (03) 9291 6500
ෆැක්ස්: (03) 9291 6565

**ජීලොන්ග්**

තැපැල්: PO Box 2086, Geelong, Victoria 3220
ස්ථානය: 5A Little Ryrie Street, Geelong, Victoria 3220
දුරකථනය: (03) 5225 1000
ෆැක්ස්: (03) 5225 1099

# අමතරව ලබාගත හැකි උපකාර

### පේරන්ට්ලයින් වික්ටෝරියා (Parentline Victoria)

දුරකථනය: 13 22 89 - පෙව 8 සිට මධ්‍යම රාත්‍රී වන තෙක් සතියට දින 7ක්

*පේරන්ට්ලයින් මගින් උපන්දා සිට වයස අවුරුදු 18 වන තෙක් දරුවන්ගේ දෙමාපියන් සහ රැකවරණකරුවන් හට මුළු ප්‍රාන්තය පුරා දුරකථන උපදේශක සේවාවක් ලබාදේ.*

### පේරන්ට්ස් වික්ටෝරියා (Parents Victoria)

දුරකථනය: (03) 9380 2158 හෝ 1800 032 023 (ග්‍රාමීය ඇමතුම්කරුවන් හට පමණි)

වෙබ් අඩවිය: www.parentsvictoria.asn.au

### වික්ටෝරියානු ඇබොරිජිනල් අධ්‍යාපන සංගමය (Victorian Aboriginal Education Association Inc.)

දුරකථනය: (03) 9416 3833

වෙබ් අඩවිය: www.vaeai.org.au

### ළමා සහ යොවුන් විය මානසික සෞඛ්‍යය සේවා (Child and Adolescent Mental Health Services)

දුරකථනය: 1300 767 299

වෙබ් අඩවිය: www.health.vic.gov.au/mentalhealth/services/child/

### ළමා ආරක්‍ෂණ සමිතිය (Children's Protection Society)

දුරකථනය: (03) 9450 0900

වෙබ් අඩවිය: www.cps.org.au

### ඕස්ට්‍රේලියානු ළමාවිය සම්බන්ධ පදනම (Australian Childhood Foundation)

දුරකථනය: (03) 9874 3922

වෙබ් අඩවිය: www.childhood.org.au/website/default.asp

### වික්ටෝරියාවේ පාසැල් කවුන්සිල් සංගමය (Association of School Councils in Victoria)

දුරකථනය: (03) 9808 2499

වෙබ් අඩවිය: www.asciv.org.au/ASCIV/Welcome.html

### පාසැල් සංවිධාන සම්බන්ධ වික්ටෝරියානු කවුන්සිලය (Victorian Council of School Organisations)

දුරකථනය: (03) 9429 5900

වෙබ් අඩවිය: www.viccso.org.au/

### වික්ටෝරියානු බහුසංස්කෘතික කොමිසම (Victorian Multicultural Commission)

දුරකථනය: (03) 9208 3184

වෙබ් අඩවිය: www.multicultural.vic.gov.au/